# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/03 - 2022 අගෝස්තු මස 08 වැනි සඳුදා - 2022.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා මාස තුනක කාල සීමාවක් ප්‍රාදේශීය සභා රැස්වීම්වලට සහභාගි නොවීම හේතුකොට ගෙන අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ මැටිවල තැන්නේ ගෙදර බන්දුල විජේකෝන් අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා නැකැත් ගෙදර නිල්මිණි නිරෝෂා විජේසූරිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, පුලස්ති පතිරණ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් නැකැත් ගෙදර නිල්මිණි නිරෝෂා විජේසූරිය, අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**පුලස්ති පතිරණ,**
තේරීම්භාර නිලධාරි,
අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2022 අගෝස්තු මස 04 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතලේ.

EOG 08 - 0045

1A - G 37182 — 16 (2022/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*